කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
ආබාධිතතා අධ්‍යයන අංශය
වෛද්‍ය පීඨය
විශ්වවිද්‍යාල ප්‍රවේශය 2019/2020
කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව)
උපාධි පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආබාධිතතා අධ්‍යයන අංශය විසින් ආරම්භ කර ඇති කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලාව දැනට ශ්‍රී ලංකාවේ මේ පිළිබඳ ඇති එකම උපාධි පාඨමාලාව වේ. න්‍යායාත්මක පන්ති පදනම් කර ගත් ඉගැන්වීම් සහ අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි ප්‍රායෝගික පුහුණුව මෙහි විෂය පථයට අදාළ වන අතර මෙම පාඨමාලාව සාර්ථකව නිම කිරීමේදී වාග් චිකිත්සක හෝ ශ්‍රවණවේදීන් ලෙස තම වෘත්තීය නිපුණතාවයන්ට අදාළව විශේෂ පුහුණුවක් ලැබෙනු ඇත. මෙම උපාධි පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වනුයේ සන්නිවේදන අපහසුතා සහිත වූවන් හා ඔවුන්ගේ පවුල් සඳහා පුනරුත්ථාපන සේවා සැපයීම හා සන්නිවේදන අපහසුතාවයන් පිළිබඳව ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම සඳහා දැනුමෙන්, ආකල්ප වලින් හා කුසලතාවයන්ගෙන් පරිපූර්ණ වූ වාග් චිකිත්සකවරුන් හා ශ්‍රවණවේදීන් බිහිකිරීමයි.

- මෙය සිව් වසරක උපාධි පාඨමාලාවක් වන අතර මොඩියුල ව්‍යුහයකින් යුත් සම්මාන 120ක පාඨමාලාවකි.
- අවසන් වසර තුළ අනිවාර්යය පර්යේෂණ ව්‍යාපෘතියකින් සමන්විතය.
- සම්පූර්ණ පාඨමාලාවේ මාධ්‍ය ඉංග්‍රීසි පමණක්ම වේ.
- අ. පො. ස. (උ.පෙළ) භෞතික විද්‍යා විෂය සමත් අයහට පමණක් ශ්‍රවණ විද්‍යා ක්ෂේත්‍රය යටතේ උපාධි පාඨමාලාව සඳහා හැදෑරිය හැකිය.

මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට කැමැත්තක් දක්වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් විය යුතය. යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට කැමති අයදුම්කරුවන්ට medicine.kln.ac.lk/shs වෙබ් අඩවියට පිවිස අන්තර්ජාලය හරහා ලියාපදිංචි විය හැකි අතර එසේ ලියාපදිංචි වීමේදී ලැබෙන යොමු අංකය පහත දක්වා ඇති අයදුම්පතෙහි වම් පස ඉහළ කෙලවරෙහි සඳහන් කර අදාළ අනිකුත් ලියකියවිලිද සමග ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

1. මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින්, ගිණුම් අංක 055100130667553 මහජන බැංකුව, කැලණිය ශාඛාවට රුපියල් (රු. 1,000/-) බැර කරන ලදුපත.
2. විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු විසින් නිලමුද්‍රාව සමගින් සහතික කරන ලද අ.පො.ස. (උ/පෙළ) 2019 ලකුණු සහිත විභාගවල ප්‍රතිඵල ලේඛන.
3. ඉහත ඕනෑම ලේඛනයක සඳහන් නම් හා අයදුම්පත්‍රයේ සඳහන් නම් අතර වෙනසක් වේ නම් දිවුරුම් පෙත්සමක්.

අයදුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි පිටු අංක 110 හි 2.2.8.24 වගන්තිය යටතේ වන පහත සුදුසුකම් සපුරාලිය යුතුය.

2019 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ.පෙළ) විභාගයේදී ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 2.2.1.1. කොටසෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව තෝරා ගනු ලබන කලා විෂය ධාරාවේ ඕනෑම අනුමත විෂයයන් 03 ක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (“S” Grades) ලබාගෙන තිබිය යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී (විභාග) කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය යන ලිපිනයට **2020 ජූලි මස 06 දිනට** හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවර **කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ (ගෞරව) උපාධිය** යනුවෙන් සඳහන් කළ යුතුය.

මෙම යෝග්‍යතා පරීක්ෂණය ංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

පරීක්ෂණය පැවැත්වෙන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය
2020.06.08

UNIVERSITY OF KELANIYA
APTITUDE TEST
Bachelor of Science (Honors) degree in Speech & Hearing Sciences (SHS) 2019/2020

(Please fill in English using BLOCK letters)

1. Full Name of Candidate (Mr. / Ms.):
2. Surname of Candidate with Initials:
3. National ID No:
4. Permanent Address:
5. Telephone No: Residence:- Mobile:-
6. E-mail Address:-
7. Preferred language to sit for the aptitude test:-
8. District in which the candidate sat for the G. C. E. (A/L) Examination 2019:
9. Results at the G. C. E. (A/L) Examination 2019:

A/L Index No: Z - Score: □.□□□

Subject	Grade	Subject	Grade
i. _____	_____	iii. _____	_____
ii. _____	_____	iv. _____	_____

I certify that the above particulars submitted by me are true and accurate.

……. ……
Date Signature of Applicant

Note:

i. Please ensure that you include (a) Deposit slip for Rs. 1,000/- (b) Certified result copies of G.C.E. (A/L) 2019, Z – Score and G.C.E. (O/L) (c) Affidavit, if documents carry a different name, in your application.

ii. Make sure you include your preference for “BSc (Special) degree in Speech & Hearing Sciences” in your application for admission to the University Grants Commission.